දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ප්‍රථම ශාස්ත්‍ර (බාහිර) 2013 පරීක්ෂණය - 2015 මැයි/ජුනි
First Examination in Arts (External) 2013 – May/June 2015

ආවිප්‍ර 1.1 - ආර්ථික විශ්ලේෂණය
EC 1.1 – Economic Analysis

කාලය පැය තුන යි

ඕනෑම ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න
සෑම ප්‍රශ්නයකට ම සමාන ලකුණු ලැබේ

---

01. (අ) පහත සඳහන් සංකල්ප පැහැදිලි කරන්න.
I. හිඟකම
II. ආවස්ථික පිරිවැය
III. අදෘෂ්‍ය හස්තය

(ආ) නිෂ්පාදන හැකියා වක්‍ර භාවිතා කරමින් පහත සඳහන් සංසිද්ධීන් පැහැදිලි කරන්න.
I. ආර්ථික වෘද්ධි ක්‍රියාවලිය
II. සේවා වියුක්තිය
III. ආර්ථික අවපාතය

(ඇ) ආර්ථිකයක සම්පත් කාර්යක්ෂමව බෙදා වෙන්කිරීමේ මාධ්‍යයක් වශයෙන් මිල යන්ත්‍රණයේ ප්‍රධාන දුර්වලතා කවරේදැයි පැහැදිලි කරන්න.

02. (අ) මිල වෙනස්වීමක ආදායම් හා ආදේශන ප්‍රතිවිපාක පදනම් කරගෙන ඉල්ලුම් නීතිය පැහැදිලි කරන්න.
(ආ) ඉල්ලුම් නීතියට පටහැනිව වෙළඳපොළ තුළ ක්‍රියාත්මක වන අවස්ථා කිහිපයක් විස්තර කරන්න.
(ඇ) ස්ථායි සමතුලිතතාව සහ අස්ථායි සමතුලිතතාව යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි ඉල්ලුම් සැපයුම් වක්‍ර ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

03. තරඟකාරී වෙළඳපොළක අලෙවි වන එක්තරා භාණ්ඩයක් සඳහා අදාළ වෙළඳපොළ ඉල්ලුම් සහ සැපයුම් ශ්‍රිත පහත දැක්වේ.

$Q_d = 300 - 3p$ (ඉල්ලුම් ශ්‍රිතය)
$Q_s = -30 + 2p$ (සැපයුම් ශ්‍රිතය)

I. එම භාණ්ඩයේ සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කරන්න.
II. සමතුලිත මිලේ දී ඉල්ලුම් හා සැපයුම් නම්‍යතාවයන් ගණනය කරන්න.
III. ඒකකයකට රු.15/= ක් වන සේ අලෙවි බද්දක් පැනවූයේ නම් බද්දේ බර ගැනුම්කරුවන් හා විකුණුම්කරුවන් අතර බෙදී යන්නේ කෙසේ ද?

04. (අ) කෙටිකාලීන නිෂ්පාදන ශ්‍රිතය හා දිගුකාලීන නිෂ්පාදන ශ්‍රිතය පදනම් වන නියාමයන් පැහැදිලි කරන්න.

(ආ) එක්තරා ව්‍යාපාරික ආයතනයක මුළු නිෂ්පාදන පිරිවැය පහත සඳහන් දත්ත මගින් ලබාදේ.

| නිමවුම් ප්‍රමාණය | 1 | 2 | 3 | 4 | 5 | 6 |
|---|---|---|---|---|---|---|
| මුළු පිරිවැය | 10 | 16 | 18 | 28 | 45 | 66 |

මෙම ආයතනයේ මුළු ස්ථාවර පිරිවැය රු. මිලියන 8 ක් ලෙස දී ඇත්නම් එම නිමවුම් මට්ටම් වලදී පහත සඳහන් පිරිවැය ගණනය කරන්න.

I. සාමාන්‍ය මුළු පිරිවැය (ATC)
II. සාමාන්‍ය විචල්‍ය පිරිවැය (AVC)
III. සාමාන්‍ය ස්ථාවර පිරිවැය (AFC)
IV. ආන්තික පිරිවැය (MC)

05. (අ) පූර්ණ තරඟකාරී වෙළඳපොළක සහ ඒකාධිකාරී තරඟ වෙළඳපොළක සමාන ලක්ෂණ සහ වෙනස් ලක්ෂණ කවරේදැයි පැහැදිලි කරන්න.

(ආ) "පූර්ණ තරඟය සෑම විටම ඒකාධිකාරයට වඩා කාර්යක්ෂම වේ' ප්‍රස්තාර සටහන් ඇසුරින් මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න.

06. (අ) ආන්තික ද්‍රව්‍යාත්මක නිෂ්පාදිතය සහ ආන්තික වටිනාකම් නිෂ්පාදිතය යන සංකල්ප භාවිතයෙන් නිෂ්පාදන සාධකයක මිල තීරණය වන ආකාරය ප්‍රස්තාරිකව පැහැදිලි කරන්න.

(ආ) "ආර්ථික බදු කුලිය භූමියට පමණක් සීමා වූ ඉපයීම් විශේෂයක් නොවේ." විමසන්න.

07. පහත සංඛ්‍යා සටහනෙහි දැක්වෙන්නේ ශ්‍රී ලංකාව සඳහා 2013 වර්ෂයට ගණනය වී ඇති ජාතික ආදායම් ගිණුම් දත්ත පෙළකි. අදාළ දත්ත යොදා ගනිමින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. (සියලුම දත්ත රුපියල් මිලියන දහස් වලිනි.)

| | |
|---|---|
| පෞද්ගලික පාරිභෝජනය | 5,797 |
| රජයේ පාරිභෝජනය | 1,733 |
| පෞද්ගලික ආයෝජනය | 1,969 |
| භාණ්ඩ හා සේවා අපනයන | 1,949 |
| භාණ්ඩ හා සේවා ආනයන | 2,776 |
| විදේශීය ශුද්ධ සාධක ආදායම් | -235 |
| ජාත්‍යන්තර ත්‍යාග හා සංක්‍රාම ලැබීම් | 729 |
| ප්‍රාග්ධන ක්ෂය ප්‍රතිභාගය | 123 |
| ව්‍යාපාර වක්‍ර බදු | 909 |

පහත සඳහන් දෑ ගණනය කරන්න.

I. දළ දේශීය වියදම
II. වෙළඳපොළ මිල යටතේ දළ දේශීය නිෂ්පාදිතය
III. වෙළඳපොළ මිල යටතේ දළ ජාතික නිෂ්පාදිතය
IV. ශුද්ධ ජාතික නිෂ්පාදිතය
V. ජාතික ආදායම්

08. (අ) උද්ධමනය සහ අවධමනය අතර වෙනස පැහැදිලි කරන්න.

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තා අනුව මෙරට නිල මිල දර්ශකය වන කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ (2006 - 2007 = 100 ලෙස සැලකූ විට) නිරපේක්ෂ අගය 2011 දී ඒකක 154 ක සිට 2012 දී ඒකක 168 දක්වා ඉහළ ගොස් තිබුණි. මෙම තොරතුරු අනුව වර්ෂ 2012 සඳහා උද්ධමන අනුපාතිකය ගණනය කරන්න.

(ඇ) අවශ්‍ය තැන්හී උචිත රූප සටහන් යොදා ගනිමින් උද්ධමනයට හේතු විස්තර කෙරෙන ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනය හා පරිවැයෙන් තල්ලුවුණු උද්ධමනය ජනිතවන ආකාරය පැහැදිලි කරන්න.

09. පහත සඳහන් සංකල්ප යුගලයන්ගෙන් ඕනෑම දෙකක් තෝරා ගෙන එම සංකල්ප යුගලයන් අතර වෙනස පැහැදිලි වනසේ සටහන් ලියන්න.

I. ගනුදෙනු චේතනාවෙන් මුදලට ඇති ඉල්ලුම සහ සමපේක්ෂණ චේතනාවෙන් මුදලට ඇති ඉල්ලුම.
II. ගෙවුම්ශේෂ ලේඛනයේ භාණ්ඩ ගිණුම සහ ජංගම ගිණුම.
III. බැංකු තැන්පතු ගුණකය සහ මුදල් ගුණකය.
IV. මූර්ත විනිමය අනුපාතිකය සහ මූර්ත සඵල විනිමය අනුපාතිකය.

✪✪✪✪✪✪✪✪✪✪✪✪✪✪✪✪✪✪✪✪✪✪✪✪✪✪✪✪✪✪✪✪✪✪✪✪✪.